විදුලි පණිවුඩ : "විශ්‍රාම වැටුප්" කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones } 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2342078

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
## ඔய்வூதியத் திணைக்களம்
## DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.
Maligawatta Secretariat,
Maligawatte,
Colombo 10.

මගේ අංකය / எனது இல. / My No. } විවැ/චක්‍රලේඛ/2007

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2007.03. 07

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2007 (1)

සියලුම අමාත්‍යාංශය ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිසා ලේකම්වරුන් / ප්‍රදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**රාජ්‍ය සේවා, පළාත් රාජ්‍ය සේවා සේවකයන් සඳහා වූ**
**දයක විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කිරීම සහ**
***වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකත්වය ලබාදීම***

මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2007 විධිවිධානයන් සම්බන්ධව තවදුරටත් පහත සඳහන් පැහැදිලි කිරීම් කරමි.

01 **වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම**

2007 ජනවාරි මස සිට දායක මුදල් අය කිරීමේදී පහත සඳහන් කරුණු වැදගත් වේ.

A අඩ වැටුප් හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබා ඇති විටදී ද සම්පූර්ණ වැටුපට දායක මුදල් අය කළ යුතුය.

B වැන්දඹු / වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා මනාපය ප්‍රකාශ කිරීම අනිවාර්ය වේ. එමෙන්ම දායක මුදල් අයකිරීමද අනිවාර්ය වේ.

C 2007 ජනවාරි මස සිට ප්‍රාථමික හා ද්විතීක මට්ටමේ නිලධාරීන් ගෙන් 6% ක් ද තෘතීයික හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගෙන් 7% ක් ද අය කළ යුතුය.

02 **වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙහි ලියාපදිංචි වීම**

මේ වන විටත් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී ඇති නිලධාරීන් / නිලධාරිනියන් පහත සඳහන් ලේඛන පමණක් මා වෙත යොමු කිරීම ප්‍රමාණවත් වේ.

i පොදු 36 / පොදු 86 'අ' ආකෘති පත්‍රය

ii කලත්‍රයාගේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත

iii කලත්‍රයාගේ හැඳුනුම්පතේ පිටපත හෝ ඡායාරූපය. (වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකය නිකුත් කිරීමේදී දයකත්ව අරමුදලේ පවත්වාගෙන යනු ලබන ලිපිගොනුව සමග ඒකාබද්ධ කිරීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.)

මුල් පත්වීම් දින සිට 2006.12.31 දින දක්වා හිඟ දයක මුදල් ගණන් බැලිය යුත්තේ කළමණාකරන සේවා 18 හා 18 (1) චක්‍රලේඛනයන්ට අනුකූලවය. එකී කාලසීමාව සඳහා නිලධාරියාගෙන් අයකල 8% ක මුදල ද රාජ්‍ය ආයතනයෙන් 12% දයකත්ව මුදල ද ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. පළාත් රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ඉහත හිඟ සම්පූර්ණ මුදල් චෙක්පත් මඟින් මෙම දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

03. මියගොස් ඇති දයකත්ව විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ධාරීන්.

අවිවාහක නිලධාරියෙකු / හෝ නිලධාරිනියක මියගොස් ඇතිවිට වැන්දඹු අනත්දරු විශ්‍රාම ක්‍රමයේ ලියාපදිංචිය අවශ්‍ය නොවේ. එවැනි නිලධාරීන්ට දයකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයේ ඇති ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ හැක.

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: 1 ජනාධිපති ලේකම්
2 අග්‍රාමාත්‍ය ලේකම්
3 අමාත්‍ය මණ්ඩල ලේකම්
4 ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
5 ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
6 සම සභාපති, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
7 ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
8 ලේකම්, මුදල් අමාත්‍යාංශය
9 අධිකාරි දයකත්ව විශ්‍රාම වැටුප්, ශ්‍රී ලංකා මහ බැංකුව
10 විගණකාධිපති.